සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**6 - ශ්‍රේණිය**

**නර්තනය (දේශීය)**

**නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02යි.**

**I කොටස**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් රූප සටහන් ඇසුරින් අංක 1 - 3 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D

(01) ඉහත රූප ඇසුරෙන් පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
(1) A (2) B (3) C (4) D

(02) D රූප සටහනේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය වන්නේ,
(1) ගාල්ල (2) මහනුවර (3) අනුරාධපුරය (4) රත්නපුරය

(03) කෝලාට්ටම් නර්තනය ඇතුළත් වන්නේ,
(1) B රූපයේ ය (2) C රූපයේ ය (3) D රූපයේ ය (4) A රූපයේ ය

(04) නම්‍යතා අභ්‍යාස පුහුණු කිරීමෙන් සිරුරේ...
(1) සමබරතාවය රැක ගැනීමට උපකාරී වේ (2) දරා ගැනීමේ ශක්තිය වර්ධනය වේ
(3) නිවැරදි ඉරියව් පවත්වා ගැනීමට හැකි වේ (4) ඉහත කරුණු සියල්ල ම ඉටු වේ

(05) නර්තනය හදාරන ආධුනික ශිල්පියෙකු තම පාද හුරුකර ගැනීම සඳහා කරනු ලබන මූලික අභ්‍යාස වන්නේ,
(1) ගොඩ සරඹ , පා සරඹ (2) පා සරඹ , මණ්ඩිපද
(3) ඉලංගම් සරඹ, දෙඹින පද (4) දොඹින පද, මණ්ඩි පද

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✓) ලකුණ ද යොදන්න.

(06) අතීතයේදී තාලම්පට හැඳින්වූයේ කෛතාලම යනුවෙනි ( )

(07) ''තෛපොංගල්...'' උත්සවය පවත්වනු ලබන්නේ පෙබරවාරි මාසයේ ය. ( )

(08) කැටයම් කලාවේ යෙදීමෙන් පාසල් සිසුන්ගේ මානසික සුවය , සංයමය හා ඉවසීම යනාදි ගුණාංග වර්ධනය වේ. ( )

(09) සමනල වන්නම නිර්මාණය කළේ නිත්තවෙල ගුණයා ගුරුතුමා ය. ( )

(10) නිදහසේ ඇවිදීම ස්ථිතික චලනයකි. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(11) ලී කෙළි නැටුමේ පෞරාණික බව ............................ දේවාලයේ ලී බාල්කයේ ඇති ලී කෙළි නැටුමෙන් විදහා දක්වයි. (ඇම්බැක්කේ/ගඩලාදෙණියේ)

(12) පහතරට බෙරයෙහි ඇස සාදා ගැනීම සඳහා ..................................... භාවිතා කරයි. (වඳුරුහම/හරක් බොකුහම)

(13) මණ්ඩිය සඳහා විලුම් දෙක අරත පරතරය ................................... වේ. (වියතකි/මිටිරියනකි)

(14) උදැසන පරිසර අසිරිය තුළින් ....................................... භාවය නිරූපණය වේ. (උත්සාහය/සතුට)

(15) ...................................... විකල්ප වාද්‍ය භාණ්ඩයක් වේ. (පන්තේරුව/වල්වලල්ල)

- **ගැලපෙන පද යා කරන්න.**

| | |
|---|---|
| (16) මූලික ඉරියව්ව | (i) දෙවොල් බෙරය |
| (17) වෙම්බුව | (ii) රබන් පද |
| (18) තාලම්පට | (iii) මණ්ඩිය |
| (19) පහතරට | (iv) කළගෙඩි |
| (20) බංකු රබාන | (v) තිත්, තෙයි |

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා <u>හිස්තැන්</u> හිස්තැන් පුරවන්න.

(1) ජේසුතුමා සමරනු ලබන්නේ .................................... උත්සවයේදී ය.

(2) රූං පෙත්තක් නිර්මාණය සඳහා ස්වභාවික පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍යකි ....................................

(3) .................................... උත්සවය හිරුට කළගුණ සැලකීම සඳහා පවත්වනු ලබයි.

(4) පහතරට නර්තන සම්ප්‍රදායේ වන්නම් .................................... ලෙස හඳුන්වයි.

(5) එස්.එම්. සව්රිස් සිල්වා මහතා .................................... නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණයෙකි.

(6) දිග්ගෙයි නැටුම .................................... නර්තන සම්ප්‍රදායට අයත් වේ.

(7) නර්තනයේ දී ශරීරය අංග, ............................, ......................... ලෙස කොටස් 3කට බෙදිය හැකිය.

(8) සරඹ නර්තනයේදී .................................... හා ........................................ ලය දෙකට අභ්‍යාස කරනු ලැබේ.

( නත්තල්, සබරගමු , පහතරට , ගොප්කොළ , විලම්භ - මධ්‍ය , සිංදුවන්නම් , තෛපොංගල් , ප්‍රත්‍යංග - උපාංග)

(02) ''රටක අනන්‍යතාව ගැමි නැටුම් මඟින් පෙන්නුම් කරයි''

(1) ගැමි නැටුම් යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(2) ඔබ දන්නා ගැමි නැටුම් 3ක් නම් කරන්න. (ලකුණු 03)

(3) ගැමි නැටුම් වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(03) (1) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)

(2) මාත්‍රා 3 තනි තිතට කවියක් ලියන්න (ලකුණු 03)

(3) මාත්‍රා 2 තනි තිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(04) ''නර්තනය ආරම්භ කිරීමට ප්‍රථම නමස්කාරය සිදු කිරීම සම්ප්‍රදායික ලක්ෂණයකි''

(1) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් නමස්කාර පදය ලියන්න. (ලකුණු 03)

(2) ගුරු ගෙදර හා සබැඳි නර්තන අධ්‍යාපනයේ චාරිත්‍ර තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ඔබ පන්තිකාමරයේ දී අනුගමනය කරන සාරධර්ම 4ක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(05) මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) විකල්ප වාද්‍ය උපකරණ

(2) එන්. ඒ. සිරිබෝහාමි ගුරුතුමා

(3) මණ්ඩිය

(4) තෛපොංගල් උත්සවය

(ලකුණු 5 ×2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

## ප්‍රායෝගික පරීක්ෂණය

**නම/විභාග අංකය :-** ..........................................................

(01) (1) කැමති ගායනයක් (ලකුණු 05)

(2) නැලවිලි කවියක් ගායනය (ලකුණු 05)

(02) (1) කැමති පා සරඹයක්/මණ්ඩි පදයක් නටා හමාර පදය නැටීම (ලකුණු 10)

(2) කළගෙඩි/ලී කෙළි නර්තනය (කණ්ඩායම් ක්‍රියාකාරකමක්) (ලකුණු 10)

(3) මාත්‍රා 2 තනි තිතට අයත් වන්නම/සිංදු වන්නමේ තානාම, කවියක් නර්තනය කිරීම (ලකුණු 10)

(4) සත්ව චරිතයක් නිරූපණය කිරීම (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## නර්තනය පිළිතුරු


**I කොටස**

(1) - 3
(2) - 4
(3) - 1
(4) - 4
(5) - 2

(6) - ✓
(7) - ✓
(8) - ✓
(9) - ✓
(10) - ✓

(11) ඇම්බැක්කේ
(12) හරක් බොකුහම
(13) මිටි රියනකි
(14) සතුට
(15) වල්වළල්ල

| | |
|---|---|
| 16) මූලික ඉරියව්ව | (i) දෙවාල් බෙරය |
| (17) වෙම්බුව | (ii) රබන් පද |
| (18) තාලම්පට | (iii) මණ්ඩිය |
| (19) පහතරට | (iv) කළගෙඩි |
| (20) බංකු රබාන | (v) තිත්, තෙයි |



(ලකුණු 1 × 20 = 20)

**II කොටස**

(01) (1) නත්තල් (2) ගොප්කොළ
(3) තෛපොංගල් (4) සින්දු වන්නම්
(5) පහතරට (6) සබරගමු
(7) ප්‍රත්‍යාංග, උපාංග (8) සමගුණ, දෙගුණ/විලම්භ, මධ්‍ය

(1 - 6 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 1 × 6 = 6, 7 - 8 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 2 × 2 = 4) (මුළු ලකුණු 10)

(02) (1) රටක ගැමි ජනතාව විසින් නිර්මාණය කරන ලද හා ඔවුන් අතර භාවිත වූ නැටුම් විශේෂය ගැමි නැටුම් ලෙස හැඳින්වේ. (ලකුණු 03)

(2) අදාළ ගැමි නැටුම් 3ක් ලිවීම. (ලකුණු 03)

(3) අදාළ ලක්ෂණ 4ක් ලිවීව (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(03) (1) සුළු තනි තිත, මැදුම් තනි තිත, මහ තනි තිත (ලකුණු 03)

(2) මාත්‍රා 3 තනි තිතට කවියක් ලිවීම (ලකුණු 03)

(3) ආවර්තය හා මාත්‍රා ලිවීම (ලකුණු 01)

තාලසංඥා (ලකුණු 01)

බෙර පදය ප්‍රස්ථාර කිරීම (ලකුණු 02)

} (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(04) (1) නමස්කාර පදය ලිවීම (ලකුණු 03)

(2) ගුරු ගෙදර හා බැඳි චාරිත්‍ර 3 ලිවීම (ලකුණු 03)

(3) පන්ති කාමරයේදී අනුගමනය කරන සාරධර්ම 4 ලිවීම (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(05) (1) මාතෘකා දෙකක් යටතේ අදාළ කරුණු ලිවීම. (ලකුණු 5 × 2 = 10)